---

**කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය - අතුරුගිරිය

2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 අංක 45 දරන පාර්ලිමේන්තු පනත මඟින් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධව ස්ථාපිත කොට ඇති අතර වැවිලි ක්ෂේත්‍රයෙහි නියුතුවන්නන්ගේ හා නියැලීමට උනන්දුවක් දක්වන පාර්ශව සඳහා අධ්‍යයන සහ වෘත්තීය සුදුසුකම් ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් මෙරට තුළ ස්ථාපිත එකම රාජ්‍ය ආයතනය වේ.

**01.** වැවිලි බෝග තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව **(NDPCT ) NVQ** මට්ටම **05**

| | | |
|---|---|---|
| කාලසීමාව | - | අවුරුදු එකයි මාස හයයි.<br>අදියර I - අවුරුදු 01 ක පූර්ණ කාලීන/අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාව<br>අදියර II - මාස 06 ක ප්‍රායෝගික පුහුණුව |
| මාධ්‍යය | - | ඉංග්‍රීසි/සිංහල |
| පාඨමාලා ගාස්තුව | - | රු. 150,000.00 |

ඇතුළත් වීමේ සුදුසුකම් :

අ.පො.ස. (උ.පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් විෂයන් තුනක් (03) සමත්වීම,

*හෝ*

කෘෂිකර්මයට හෝ වැවිලි ක්ෂේත්‍රයට අදාළ NVQ 04 මට්ටමේ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

**අයදුම් කරන ආකාරය :**

මෙම පාඨමාලාව සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025 ජුනි මස 13 වැනි** දිනට හෝ ඊට පෙර පහත දක්වා ඇති ආකෘතිය අනුව අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය, ශ්‍රී ලංකාව යන ලිපිනයට එවිය යුතු අතර ඉල්ලුම් කරන පාඨමාලාව ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් හෝ www.nipm.gov.lk වෙබ් අඩවිය හරහා මාර්ගගතව අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

වැඩිදුර විස්තර සඳහා - 011-2770232, 070-3455785, 077-6441028

05-221